---

**හක්මන ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය පකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 02 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 13 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව හක්මන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට හක්මන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබූ ශේෂ පිරික්සුමෙහි එකතුව තුල රු.23,951,536 ක් වූ ආදායම් සහ එකතුව රු.25,000,786 ක් වූ වියදම් අත්හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ගලි බවුසරයක්, ට්‍රැක්ටරයක් හා ට්‍රේලරය, හා වතුර බවුසරය වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර මෙම වාහන ස්ථාවර වත්කම් ලේඛණයේද සටහන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03 කට අයත් රු.61,353,852 ක් වූ වියදම් ප්‍රාග්ධන වියදම් වැය ලේඛනයේ දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 12 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.22,901,604 ක් වූ අතර පාලන ගිණුම් අනුව වටිනාකම රු.22,573,964 ක් වූයෙන් වෙනස රු.327,640 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.3,992,836 ක් වූ අතර ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.55,928,949 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 96,318,835 ක් ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,049,250 ක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.626,428 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 401 | 397 | 805 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 54 | 763 | 1 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 104,438 |
| (ii) | මුද්දර ගාස්තු | 3,395,639 |

2.2.3 ජල ගාස්තු

2012 දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයින් 835 කගෙන් රු.1,073,071 ක හිඟහිටි ශේෂයක් වූ අතර එකී හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග හෝ සැපයුම් විසන්ධි කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.2.4 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයේ වරිපනම් ගාස්තු අයවන ගෘහ පාරිභෝගිකයින් 1460 ක්ද, වාණිජ පාරිභෝගිකයින් 118 ක්ද, රජයේ දේපල 38 ක් ලෙසට 1616 ක පාරිභෝගිකයින් සංඛ්‍යාවක් විය.2012 දෙසැම්බර් 31 දිනට ලේඛණ අනුව රු.582,133 ක හිඟහිටි ශේෂයක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාපති, උප සභාපති, ඇතුළු මන්ත්‍රීවරු 08 දෙනෙකු 2012 වර්ෂයේදී වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.8,844,000 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු.14,730,687 ක වූයෙන් සභා අරමුදලට රු.5,886,687 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,976,108 ක් විය.

2.4 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටුවක් ද පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ සභාපතිවරයාගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය